## උතුරු පළාත් රාජ්‍ය සේවයේ සංස්කෘතික නිලධාරී (MN – 4) III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2018

උතුරු පළාත් රාජ්‍ය සේවයේ සංස්කෘතික නිලධාරි තනතුරට ඩෙල්ෆ් දූපත, මාන්තෙයි නැගෙනහිර හා වෙට්ටිකුලම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින පුරප්පාඩු **තුනක් (03)** සඳහා බඳවා ගැනීමට විවෘත තරඟ විභාගයක් **2018 ඔක්තෝම්බර් මස** යාපනයේ පැවැත්වීමට නියමිත බව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමා විසින් දන්වා ඇත. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වනුයේ **05.10.2018** වන දිනයයි.

### 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 2013.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කරන ලද සංස්කෘතික නිලධාරි තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාව/ බඳවා ගැනීමේ ක්‍රමයේ නිර්දේශ කරන ලද කොන්දේසීන්, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 **දරණ** 2013.07.03 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන ආයතන සංග්‍රහය යනාදීන්ටත් හා බඳවා ගැනීමේ කාලපරිච්ඡේදය තුළ මේ අතරින් ක්‍රියාත්මක වන යම්කිසි සංශෝධනයන්ට අනුකූලව තෝරා ගන්නා වූ විභාග අපේක්ෂකයන් සංස්කිතක නිලධාරී තනතුරේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 තරඟ විභාගය මඟින් සමත් වන විභාග අපේක්ෂකයන් පත්වීම් ලබන දින සිට වසර තුනක (03) කාලයක් පරිවාස කාලයට යටත් කරන පදනම යටතේ III වන ශ්‍රේණියේ තනතුරට පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉහත තනතුරේ III වන ශ්‍රේණියට පත් කරන ලද දින සිට වසර තුනක (03) කාල පරිච්ඡේදය තුළ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුයි.

02.3 මෙම සේවය ස්ථාන මාරුවීමට යටත් වූ සේවාවක් වේ. එබැවින් මෙම පත්වීම් ලබන්නන් උතුරු පළාතේ කුමණ ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුයි යන කොන්දේසියට යටත් විය යුතුයි..

02.4 එක් සේවා ස්ථානයකින් පත්වීම් ලබන්නන්, එම සේවා ස්ථානයේම අවම වශයෙන් වසර පහක් (05) අඛණ්ඩව සේවය කළ යුතුයි යන කොන්දේසිය අනිවාර්ය කොන්දේසියකි..

02.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගිකව නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුකූලව ද පත්වීම් දින සිට වසර පහක් (05) අවසන්වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂාව සමත් විය යුතු.

02.6 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත්වීම් ලබා දීමට නියමිත අයගේ සංඛ්‍යාව **තුනක් (03)** වේ. කෙසේ වුව ද දැනුම් දෙන ලද පුරප්පාඩු සම්බන්ධයෙන් සමහර පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු පූර්ණය නොකර සිටීමට පත්වීම් බලධාරියාට බලය ඇත්.

### 03 වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට අනුකූලව වැටුප් කාණ්ඩය **MN 4 - 2016** ට අනුව සංස්කෘතික නිලධාරී සේවයේ - III වන ශ්‍රේණියට ඒකාබද්ධ වැටුප් අනුපාතය රුපියල් **31, 490 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 05 x 750 – 57, 550/-** වේ. (රුපියල් 32,825 වැටුප් පියවරට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි) කෙසේ වුව ද ඉහත චක්‍රලේඛයේ II වන වගුවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලවන පරිදි වැටුප් ගෙවිය යුතුයි

### 04 සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ කුමණ ප්‍රදේශයක වුවද සේවය කිරීමට යෝග්‍ය වන පරිදි ශාරීරික වශයෙන් නිරෝගීමත් විය යුතු අතර මනා චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුයි.

04.3 අ) අයදුම්කරු උතුරු පළාත තම ස්ථිර පදිංචි ස්ථානය කොටගත් කෙනෙකු විය යුතුයි. මෙම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ප්‍රථම වසර හයක (06) කාල පරිච්ඡේදය තුළ අවම වශයෙන් වසර තුනක් (03) හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුයි.

**அல்லது**

ආ) අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාත උපන් ස්ථානය කොටගත් හා අවම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩව පදිංචිව සිටිය යුතුයි (*සම්මුඛ පරීක්ෂණයේ දී තම ඡන්ද ලැයිස්තුවෙ සහතික කරන ලද පිටපත ඉදිරිපත් කළ යුතුයි)

04.4 අයදුම්පත භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවන ලද **සියළුම සුදුසුකම්** අපේක්ෂකයා විසින් සපුරා තිබිය යුතුයි..

04.5 අයදුම්පත භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුට **වයස අවුරුදු** 21 නො අඩු, **වයස අවුරුදු** 35 ට වඩා අධික නොවිය යුතුයි..

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්:-

**05.1** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් පහත සඳහන් විෂයයන්ගෙන් කුමක් හෝ විෂයයකට විශේෂ උපධියක් (Special Degree) හිමිකර තිබිය යුතුයි.
(භාෂාව, දාර්ශනික විද්‍යාව, පුරාවිද්‍යාව, හින්දු ශිෂ්ටාචාරය, බෞද්ධ ශිෂ්ටාචාරය, ඉස්ලාමීය ශිෂ්ටාචාරය, ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය, නාට්‍ය හා වේදිකාව, ක්ෂුද්‍ර කලාව, සමාජවිද්‍යාව ඉතිහාසය හෝ මානව විද්‍යාව)

**හෝ**

**05.2** ඉහත **05.1 ඡේදයේ** සඳහන් විෂයන් අතරින් අවම වශයෙන් විෂයයන් දෙකක් ප්‍රධාන විෂයයන් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් (General Degree) හිමිකර තිබිය යුතුයි.

## 06. බඳවාගන්නා ක්‍රමය :-

06.1 ලිඛිත විභාගය මගින් කුසලතා පදනම මත හා බඳවා ගන්නා අවස්ථාවේදී ක්‍රියාත්මකව පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ සැලැස්ම, ජාතික හා පළාත් ප්‍රතිපත්තින්ට එකඟව සංස්කෘතික නිලධාරී තනතුරට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව එළිදරව් වුවහොත් මෙම තනතුර සඳහා වන හිමිකම අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සුදුසුකම්, හා ලියකියවිලි පරීක්ෂා කරනු ලැබේ. මේ සඳහා ලකුණු ප්‍රදානය කරනු නොලැබේ.

06.2 ඉහත සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන්, ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ පරිදි පවතින පුරප්පාඩුවලට අනුකූලව පත්වීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

06.3 පුරප්පාඩුවලින් 03% ක් ආබාධිතයන්ට (විකලාංගිකයන්) වෙන් කරනු ලැබේ. අපේක්ෂකයා පත්වීම සඳහා තේරිපත් වන විට අදාළ තනතුරේ සේවය කිරීම සඳහා තම ආබාධිත තත්වය (විකලාංග) බාධාවක් නොවන බවට විශේෂිත වෛද්‍ය පරීක්ෂණයක් මගින් ඔප්පු කළ යුතුයි.

## 07. විභාග ගාස්තු :-

අපේක්ෂකයන් පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් 500.00 ක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ **"3401"** යන ගිණුමට බැර කළ කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැලවෙන සේ අලවා එවිය යුතුයි. කුමණ හේතුවක් නිසාවත් මෙම ගාස්තු නැවත ගෙවනු නොලබන අතර මෙම ගාස්තුව වෙනත් විභාගයක් සඳහා මාරු කර ගැනීමට අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම් කළ යුතු ක්‍රමය :-

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයෙන් යුත් (සෙ''මී 21 x සෙ''මී 29) කඩදාසියේ 1 සිට 10 දක්වා වූ ඡේද පළමු පිටුවේ ද, 11 සිට 15 දක්වා වූ ඡේද දෙවන පිටුවේ ද, ඉතිරි කොටස් අනෙක් පිටුවෙද ඇතුල්වන පරිදි අයදුම්පත් සකස් කරගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **05.10.2018** දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් යොමු කළ යුතුයි

08.2 අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස උඩකොටසේ **"සංස්කෘතික නිලධාරි III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම"** සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ නොකරන ලද අයදම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3 අයදුම්පතේ ඡායා පිටපත මබ වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පතේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත් යනාදීන් භාරගනු නොලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමා විසින් නිකුත් කරනු ලැබේ. **විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම අයදුම්කරු සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැලකිය යුතුයි.**

08.4 අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කළ පසු පුවත්පත් මගින් දැන්වීමක් නිකුත් කරනු ලැබේ. දැන්වීම පළ වී කිසියම් අපේක්ෂකයෙකුට විභාග දිනට අවම වශයෙන් දින තුනකට (03) ප්‍රථම හෝ විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැති නම්, ප්‍රවේශ පත්‍ර නොලැබීම සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සමඟ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, දුරකථන අංක - 021 221 9940)

**සටහන :-**

ඉල්ලීම් ලිපිය, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශපත්‍ර යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

08.6 විභාගය සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. තවද අයදුම්පත් අවසාන දිනට ප්‍රථම ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ හා සම්බන්ධ දැන්වීම් කිසිවක් නිකුත් කරනු නොලැබේ.

.

## 09. අනන්‍යතාවය තහවුරු කිරීම :-

විභාග අපේක්ෂකයන් තමන් පෙනී සිටින සෑම විෂයන්ටම නිරීක්ෂක තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය තහවුරු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද ජාතික හැඳුනුම් පත

(ii) වලංගු විදේශ ගමන්බලපත්‍රය.

ඉහත සඳහන් කරන ලද ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමේ හිමිකම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, ගේ අභිමතය පරිදි ප්‍රතික්ෂේක කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නිමයන්ට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නියමයන් උල්ලංඝනය කිරීම යනු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමා විසින් පනවනු ලබන දඬුවමට යටත් වීමට සිදුවේ.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතා අවධානයෙන් යුතුව සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. මෙම විභාග නීතිරීති ප්‍රකාර කිසියම් අපේක්ෂකයෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමණ අවස්ථාවකදී හෝ වුව ද සුදුසුකම් රහිත බව කුමක් හෝ අවස්ථාවක තොරතුරු දැන ගැනීමට ලැබුණහොත්, එම අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමේ හිමිකම වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති යම්කිසි තොරතුරක් අසත්‍ය බවට ඔප්පු වුවහොත් ඕනෑම අවස්ථාවක එම පුද්ගලයා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**අයදුම්කරුවන් සියළු දෙනාම තම අත්සන සහතික කරවා ගැනීම අත්‍යාවශ්‍ය වේ..** රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අයදුම්කරු තම ආයතන ප්‍රධානියා හෝ එම ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියා මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි, සාම විනිසුරු, දිවුරුම්දීමේ අධිකාරි, නීතිඥවරයෙකු, නොතාරිස්වරයෙකු, නාවිකහමුදා, යුදහමුදා, ගුවන් හමුදා යන ත්‍රිවිධ හමුදාවන්හි අණදෙන නිලධාරි, රුපියල් 240,360.00 ට නොඅඩු වටිනාකමක් වාර්ෂික ඒකාබද්ධ වැටුප් ලබන රජයේ ස්ථිර හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙක්, ආගමික පූජා ස්ථානහාර පූජක පක්ෂයේ නායකයන් යන අයගෙන් කෙනෙකු සහතික කළ යුතුයි.

## 12. විභාගය සඳහා වන සැලැස්ම :-

මෙම විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් දෙකින්ම පවත්වනු ලැබේ. අයදුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු ලබන්නේ නැත. තනතුර සඳහා වන විෂය නිර්දේශය පහත් සඳහන් පරිදි වේ.

| අංකය | ප්‍රශ්න පත්‍ර | විෂය නිර්දේශය | කාලය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය හැකියාව හා තර්කානුකූලව තීරණය කිරීමේ තීක්ෂණ බුද්ධිය මැන බැලීම සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කරන විවිධ තේරීම් හා කෙටි පිලිතුරු සඳහා වන ප්‍රශ්න 50 ක් ඇතුළත් කරන ලද ප්‍රශ්න පත්‍රයක් වේ. අපේක්ෂකයන් විසින් සියළුම ප්‍රශ්නවලට පිලිතුරු සැපයිය යුතුයි. | පැය 01 | 100 |
| 02. | සාමාන්‍ය දැනුම | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ" සංස්කෘතික, අධ්‍යාපනය, විද්‍යාව, දේශපාලනය, ආර්ථිකය සම්බන්ධ දැනුම, සමාජීය, දේශීය, ප්‍රාදේශීය හා ලෝක අධ්‍යන පරිශ්‍රය සම්බන්ධ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න වලින් යුත් ප්‍රශ්න පත්‍රයකි. | පැය $01^1/_2$ | 100 |

**සටහන** :-

මෙම විභාගය තරග විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබීමට සෑම ප්‍රශ්න පත්‍රයකටම වෙන් කරන ලද ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහක් (40%) අපේක්ෂකයා විසින් ලබා ගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් මෙම තරග විභාගයෙන් ලබා ගන්නා ලද සම්පූර්ණ ලකුණු ප්‍රමාණය කුසලතා අනුපිළිවෙළ (Merit Order) අවධානයට ලක් කරනු ලැබේ.

13. අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවිය මගින් නිකුත් කරනු ලැබේ. අනතුරුව විභාගයට පෙනී සිටි සෑම අපේක්ෂකයන්ටම තැපැල් මගින් ප්‍රතිඵල යොමු කරනු ලැබේ.

14. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමා සතුය. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ වෙනස්කමක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ

15. මෙම විභාගය හා සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිසීමෙන් දැක බලාගත හැකිය.

**අ. සිවබාලසුන්දරන්**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත..
07.09.2018